# මැ.කො.ගේ නියෝග නොතකමින් ජනතාවට තුටු පඬුරු දෙනවා

ලක්බිම - පැෆරල්

ගයාත්‍රි ගීගනආරච්චි

**ජනාධිපතිවරණයට ඉදිරිපත්ව සිටින අපේක්ෂකයන් මැතිවරණ නීති නොසලකමින් දිගින් දිගටම මහජනතාවට විවිධ තුටු පඬුරු දෙමින් සිටින බව පැෆරල් සංවිධානය පවසයි.**

මැතිවරණ කොමසාරිස්වරයා විසින් එම ප්‍රදානයන් තහනම් කර ඇතත් ඒවා නොසලකමින් මෙලෙස තුටු පඬුරු ප්‍රදානය කිරීම ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇතැයි පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා පැවැසීය.

අපේක්ෂකයන් ප්‍රවර්ධනය වන ආකාරයට මෙලෙස තුටු පඬුරු දීමෙන් ජනමතයට පැහැදිලි ලෙසම බලපෑමක් එල්ල වන බවත් එමඟින් නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට බාධාවක් වන බවත්, පැෆරල් සංවිධානය පෙන්වා දෙයි.

මේ අතර මැතිවරණ නිලධාරීන්ට පහරදීම, පක්ෂ ක්‍රියාකාරීන්ට පහරදීම හා වෙඩි තැබීම් ආදිය පිළිබඳවද දිගින් දිගටම තොරතුරු වාර්තා වන බවද එම සංවිධානය පවසයි.